# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1981/44 - 2016 අගෝස්තු මස 24 වැනි බදාදා - 2016.08.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 04/2016

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එස්. ආර්. ආටිගල,
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්.

2016 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

***1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත***

*ආඥාව*

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, 2016 අගෝස්තු මස 25 වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| ශීර්ෂ අංක (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරු බදු ප්‍රමාණය වරණීය (4) | තීරු බදු ප්‍රමාණය සාමාන්‍ය (5) | ප්‍රමාණ ඒකක (6) |
|---|---|---|---|---|---|---|
| 22.07 | | | පරිමාව අනුව මද්‍යසාර සැර ප්‍රමාණයෙන් 80% ක හෝ ඊට වැඩි මද්‍යසාර ප්‍රමාණයක් ඇති ස්වභාවය වෙනස් නොකළ ඊතයිල් මද්‍යසාරය ; කවර සැර ප්‍රමාණයකින් හෝ ස්වභාවය වෙනස් කළ ඊතයිල් මද්‍යසාරය සහ අනෙකුත් ස්ප්‍රීතු. | | | |
| | | | | | | |
| | 2207.10 | - | පරිමාව අනුව මද්‍යසාර සැර ප්‍රමාණයෙන් 80% හෝ ඊට වැඩි මද්‍යසාර ප්‍රමාණයකින් යුත් ස්වභාවය වෙනස් නොකළ ඊතයිල් මද්‍යසාරය | | ලීටරයට රු. 500/- | ලීටර් |
| | 2207.20 | - | කවර මද්‍යසාර ප්‍රමාණයකින් හෝ ස්වභාවය වෙනස් කළ ඊතයිල් මද්‍යසාරය සහ අනෙකුත් ස්ප්‍රීතු වර්ග : | | | |
| | 2207.20.10 | --- | සුරාබදු ආඥා පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව ස්වභාවය වෙනස් කළ ස්ප්‍රීතු | | ලීටරයට රු. 500/- | ලීටර් |
| | 2207.20.20 | --- | පැඟිරි තෙල් පරීක්ෂා කිරීම සඳහා ආනයනය කළ පැඟිරි තෙල් ස්ප්‍රීතු ; ගුවන් යානාවලින් අයිස් ඉවත් කිරීම සඳහා ආනයනය කළ කාර්මික ස්ප්‍රීතු | | ලීටරයට රු. 500/- | ලීටර් |
| | 2207.20.90 | --- | අනෙකුත් | | ලීටරයට රු. 500/- | ලීටර් |

09 - 531

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.